වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
பெருந்தோட்டங்கள் மற்றும் சமூக உட்கட்டமைப்பு அமைச்சு
**Ministry of Plantation and Community Infrastructure**

පොල් සංවර්ධන අධිකාරිය
தெங்கு அபிவிருத்தி அதிகாரசபை
**Coconut Development Authority**

මගේ අංකය / எனது இலக்கம் / My No. පොසංඅ/01/16/05 - Computer

දිනය / திகதி / Date 2025.10.21

EWIS PERIPHERALS (PVT) LTD.
24
27 OCT 2025
RECEIVED

කළමනාකරු,
EWIS Peripherals
(pvt) Ltd,
Colombo - 03

**ඩෙක්ස්ටොප් පරිගණක මිලදී ගැනීම්.**

පොල් සංවර්ධන අධිකාරියට මේ සමඟ අමුණා ඇති පිරිවිතර වලට අනුකූලව පහත සඳහන් ඩෙක්ස්ටොප් පරිගණක මිලදී ගත යුතුව ඇති අතර, ඒ සඳහා ඔබගේ මිල ගණන් මෙයින් කැඳවනු ලැබේ.

| වර්ගය | ප්‍රමාණය | ලංසු සුරක්ෂණය |
|---|---|---|
| Desktop | 03 | 100,000.00 |

වෙළඳ නාමය හා සහ වර්ගය, වගකීම් කාලය, අළුත්වැඩියා සහ සේවා කිරීම්, උපාංග සැපයීමේ හැකියාව සහ සැපයීම් කල හැකි දිනය ආදිය සියළු විස්තර ඔබගේ මිල ගණන් ලිපියේ ඇතුළත් විය යුතු අතර ඉදිරිපත් කරන මිල ගණන් අවම වශයෙන් දින 60 ක් වලංගු විය යුතුය.

ඔබගේ මිල ගණන්පත සමඟ ඉහත සඳහන් වටිනාකමින් යුතු පිළිගත් බැංකුවකින් ලබා ගන්නා ලද ගන්නා ලද ලංසු සුරක්ෂණය **(Bid Bond)**, සභාපති, පොල් සංවර්ධන අධිකාරිය, අංක 54, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05 නමට දින 90 ක් වලංගු වන පරිදි ඉදිරිපත් කළ යුතු අතර, ලංසු සුරක්ෂණය ඉදිරිපත් කලයුතු ආකෘතියේ පිටපතක් මේ සමඟ අමුණා ඇත. ආපසු ගෙවිය හැකි මුදල් තැන්පතු ලෙස පොල් සංවර්ධන අධිකාරියේ මුදල් අංශයේ තැම්පත් කල හැකිය. ලංසු සුරක්ෂණයක් නොමැතිව ඉදිරිපත් කරනු ලබන මිල ගණන්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඔබ වෙත මෙම ඩෙක්ස්ටොප් පරිගණක සැපයීම සම්බන්ධ ඇණවුම් පැවරුවහොත් එම ඇණවුමේ වටිනාකමින් 10% ක කාර්යය සාධනය ඇපකරයක් (Performance Bond) සභාපති, පොල් සංවර්ධන අධිකාරිය, අංක 54, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05 නමට දින 180 ක් වලංගු වන පරිදි ඉදිරිපත් කළ යුතු අතර, ඇණවුම් ලැබී දින 30 ක් ඇතුළත මෙම භාණ්ඩ පොල් සංවර්ධන අධිකාරිය වෙත සැපයිය යුතු වේ.

මේ සඳහා ඔබගේ මිල ගණන් 2025.11.01 දින ප.ව. 02.00 ට පෙර සභාපති, ප්‍රසම්පාදන කමිටුව, පොල් සංවර්ධන අධිකාරිය, අංක 54, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ පාලන අංශයේ තබා ඇති අංක 04 දරන ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හැකිය. මිල ගණන්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවර **"ඩෙක්ස්ටොප් පරිගණක මිලදී ගැනීම 2025"** යන්න අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතු වේ.

**Head Office** : No 54, Nawala Road, Narahenpita, Postal Code 00500, Colombo 05, Sri Lanka
**Head Office** : +94 112 502 502 - 4
**Chairman** : +94 112 502 501
**Email** : chairman@cda.gov.lk
**Fort Office** : No. 11, Duke Street, Postal Code 00100, Colombo 01, Sri Lanka
**Marketing Dev. & Res, Division** : 0112 421 028
**Processing Dev. Division** : 0112 322 796
**Website** : www.cda.gov.lk